(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ වක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 2500 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජීමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවද, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක 251-3541 හා WP PA – 3837 ක දරන කැබරථ සඳහා පිළිවෙලින් 2013 හා 2018 වර්ෂවල සිට 2025 පෙබරවාරි 14 විගණන දින දක්වා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 29 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත කොට ප්‍රධාන සේවාවන් 5 කට අදාළව ප්‍රශස්ත ඉලක්කයන් නිරණය කර එම ඉලක්ක පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදයන්ට අනුව සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සෑම වර්ෂයකම ජනවාරි 15 වන දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2024 වර්ෂයට අදාළව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) වෙරුගල් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ යුධ ගැටුම්වලින් විපතට පත් පවුල් සඳහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ සියයට සියයක වැඩ අවසන් කළ නිවාස 16 ක් සඳහා තවදුරටත් ගෙවිය යුතු රු.799,000 ක මුදල විගණන දින වූ 2024 අගෝස්තු 21 දින වන විටක් වසර 02 කට වැඩි කාලයක් අදාළ සමෘද්ධි බැංකු ගිණුම්වලට නිදහස් කර නොතිබුණි.

(ආ) වෙරුගල් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ 2022 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලසීමාව තුළ වැඩ අවසන් කළ නිවාස 08 ක් සඳහා ගෙවන ලද අවසන් වාරික මුදලින් රු.471,000 ක මුදල් ප්‍රමාණයක් අදාළ සමෘද්ධි බැංකු වෙත මාරුකර තිබුණු නමුත් 2024 අගෝස්ත් 21 විගණන දින වන විටත් එම මුදල් ප්‍රතිලාභීන් වෙත නිදහස් කර නොතිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලබන අඩු ආදායම් ලාභීන් හා නැවත පදිංචි වූ අවතැන් පවුලු වෙනුවෙන් 2021 සහ 2023 වර්ෂ වල කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හදුනාගෙන ලබාදුන් රු.600,000 නිවාස 04 ක් සහ රු.100,000 ක නිවාස 15 ක ඉදිකිරීම් සම්පූර්ණ වී නොතිබුණි. මේ වෙනුවෙන් සම්පූර්ණ නොකරන ලද නිවාස 39 ක් වෙනුවෙන් හදුනා ගන්නා ලද ප්‍රතිලාභ ප්‍රමාණය රු.29,400,000 ක් වේ.

(ආ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2023 හා 2024 වර්ෂවල අක්කර 27.75 ක මුංඇට වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් 39 දෙනෙකු වෙත රු.371,850 ක් පිරිවැය වූ මුංඇට බීජ කිලෝග්‍රෑම් 977.5 ලබාදී තිබුණු අතර එයින් අපේක්ෂිත අස්වැන්න කිලෝග්‍රෑම් 11100 ක් වූ අතර එම ප්‍රමාණය වටිනාකම අනුව රු.14,874,000 ක් විය. නමුත් අපේක්ෂිත අස්වනු ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් 3592 ක් එනම් රු.4,813,280 ක ආදායමක් පමණක් ළඟාකර ගැනීමට සිදු වීමෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

(ඇ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2023 හා 2024 වර්ෂවල උඳු වගාකිරීම සඳහා ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත රු.45,500 ක් පිරිවැය වූ උඳු කිලෝග්‍රෑම් 35 ක් ලබාදී තිබුණු අතර එයින් අපේක්ෂිත අස්වැන්න කිලෝග්‍රෑම් 1150 ක් වූ අතර එම ප්‍රමාණය වටිනාකම අනුව රු.1,495,000 ක් විය. නමුත් අපේක්ෂිත අස්වනු ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් 595 ක් එනම් රු.773,500 ක ආදායමක් පමණක් ළඟාකර ගැනීමට සිදුවීම තුළින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

(ඈ) වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 වර්ෂයේදී යුද්ධයෙන් අවතැන්වූ ජනතාව වෙනුවෙන් ස්ථිර නිවාස ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා වූ අංක SMRHC/RD/04/01 දරන ලිපියේ 4.4 ඡේදය ප්‍රකාරව වටිනාකම් රුපියල් 600,000ක් බැගින් වූ නිවාස පහලොවක් ඉදිකිරීමට එකතුව රුපියල් මිලියන 8.96ක මුළු මුදලම ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම්වලට අදියර හතරකින් 2021 වර්ෂයේ තැන්පත් කර තිබූ නමුත් මේ වන විටත් මෙම නිවාස ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම වී නොමැතිව පැවැති අතර ඉදිකිරීම් කටයුතු සඳහා ලබාදුන් එකතුව රුපියල් මිලියන 1.227 ක් ප්‍රතිලාභීන් 15කගේ සමෘද්ධි බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණි.

(ඉ) 2021 වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිත නිවාස ව්‍යාපෘතිය මොරවැව, පදවි ශ්‍රී පුර , ගෝමරන්කඩවල ,සේරුවිල ,කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියමිත කාලයේදී අවසන් කිරීමට සැලසුම් කර නොතිබුණු අතර මේ වන විටත් රුපියල් මිලියන 01 ක නිවාස 83 ක හා රුපියල් 600,000 නිවාස 74 ක වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2023 හා 2024 වර්ෂවල අක්කර 27.75 ක මුංඇට වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් 39 දෙනෙකු වෙත රු.371,850 ක් පිරිවැය වූ මුංඇට බීජ කිලෝග්‍රෑම් 977.5 ලබාදී තිබුණු අතර එයින් අපේක්ෂිත අස්වැන්න කිලෝග්‍රෑම් 11100 ක් වූ අතර එම ප්‍රමාණය වටිනාකම අනුව රු.14,874,000 ක් විය. නමුත් අපේක්ෂිත අස්වනු ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් 3592 ක් එනම් රු.4,813,280 ක ආදායමක් පමණක් ළඟාකර ගැනීමට සිදු වීමෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

(ඇ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2023 හා 2024 වර්ෂවල උඳු වගාකිරීම සඳහා ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත රු.45,500 ක් පිරිවැය වූ උඳු කිලෝග්‍රෑම් 35 ක් ලබාදී තිබුණු අතර එයින් අපේක්ෂිත අස්වැන්න කිලෝග්‍රෑම් 1150 ක් වූ අතර එම ප්‍රමාණය වටිනාකම අනුව රු.1,495,000 ක් විය. නමුත් අපේක්ෂිත අස්වනු ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් 595 ක් එනම් රු.773,500 ක ආදායමක් පමණක් ළඟාකර ගැනීමට සිදුවීම තුළින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි.

(ඈ) වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 වර්ෂයේදී යුද්ධයෙන් අවතැන්වූ ජනතාව වෙනුවෙන් ස්ථිර නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වූ අංක SMRHC/RD/04/01 දරන ලිපියේ 4.4 ඡේදය ප්‍රකාරව වටිනාකම් රුපියල් 600,000ක් බැගින් වූ නිවාස පහලොවක් ඉදිකිරීමට එකතුව රුපියල් මිලියන 8.96ක මුළු මුදලම ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම්වලට අදියර හතරකින් 2021 වර්ෂයේ තැන්පත් කර තිබූ නමුත් මේ වන විටත් මෙම නිවාස ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම වී නොමැතිව පැවැති අතර ඉදිකිරීම් කටයුතු සඳහා ලබාදුන් එකතුව රුපියල් මිලියන 1.227 ක් ප්‍රතිලාභීන් 15කගේ සමෘද්ධි බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණි.

(ඉ) 2021 වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිත නිවාස ව්‍යාපෘතිය මොරවැව, පදවි ශ්‍රී පුර , ගෝමරන්කඩවල ,සේරුවිල ,කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියමිත කාලයේදී අවසන් කිරීමට සැලසුම් කර නොතිබුණු අතර මේ වන විටත් රුපියල් මිලියන 01 ක නිවාස 83 ක හා රුපියල් 600,000 නිවාස 74 ක වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2021 වර්ෂයේ නිවාස ඉදිකිරීමට අදාළ ප්‍රගතිය දැක්වෙන වාර්තා අනුව සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රුපියල් ක්600,000නිවාස වැඩසටහනෙහි ප්‍රතිලාභීන් 30ක් හා රුපියල් මිලියනයේ වැඩසටහනෙහි ප්‍රතිලාභීන් 32 ක් සම්පූර්ණයෙන්ම නිවාස ඉදිකර අවසන් බවට දක්වා තිබුනද, මෙම නිවාස වැඩසටහනේ ප්‍රතිලාභීන් 44 කගේ මූලාශ්‍රධාර එකතු වටිනාකම රුපියල් 2,308,000 ක් මේ වන විටත් සමෘද්ධි බැංකු ගිණුමේ රඳවා තබාගෙන සිටීම හේතුවෙන් ඔවුන්ගේ නිවාසවල වැඩ සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණනය වෙත ඉදිරිපත් කළ වාර්තාවන් සමඟ නිවාසවල භෞතික ප්‍රගතිය එකඟ නොවීය.

(උ) මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක වන 2021 වර්ෂයේ නිවාස ව්‍යාපෘතියේ රුපියල් 600,000 ක නිවාස 30 හා රුපියල් මිලියනයේ නිවාස 31 ට අදාළව අවසන් වාරික මුදල් එකතු වටිනාකම් ලෙස 2022 වර්ෂයේදී පිළිවෙලින් රුපියල් 2,909,250 ක් හා රුපියල් 2,149,225 අවස්ථා 04 කදී මොරවැව සමෘද්ධි බැංකුව වෙත යවා තිබුණි. නමුත් මෙම නිවාසවල ප්‍රගතිය අනුව රුපියල් 600,000 නිවාස 16 ක හා රුපියල් මිලියනයේ නිවාස 21 ක භෞතික වැඩ අසම්පූර්ණව තිබූ අතර සමෘද්ධි බැංකුවේ ශේෂ වශයෙන් රුපියල් මිලියනයේ නිවාස වැඩසටහනෙන් නිවාස ප්‍රතිලාභීන් 22 කගේ රුපියල් 3,365,000 ක්ද, රුපියල් 600,000 නිවාස වැඩසටහනෙන් නිවාස ප්‍රතිලාභීන් 14 කගේ රුපියල් 1,293,000 ක්ද වශයෙන් පැවතුණි. මේ අනුව වැඩ අවසන් නොකරන ලද නිවාස ප්‍රතිලාභීන්ගේ නිවාස වාරික මුදල් භාණ්ඩාගාරය වෙත නොයවා වසර 03 කට ආසන්න කාලයක් සමෘද්ධි බැංකුවේ නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි.

(ඌ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ අංක MOUD&H/RD/04/01 හා 2023 අප්‍රේල් 27 දිනැති චක්‍රලේඛයේ 4.3.5 වගන්තිය අනුව 2023 නිවාස ව්‍යාපෘතිය 2023 නොවැම්බර් 30 දිනට පෙර සම්පූර්ණ කළ යුතු වුවත් මොරවැව, පදවිශ්‍රීපුර, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර මේ වන විටත් රුපියල් මිලියනයේ නිවාස 41 ක සහ රුපියල් 600,000 නිවාස 33 ක වැඩ කටයුතු අවසන් කර නොතිබුණි.

4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් ව්‍යාපෘතිය 2021 යටතේ (RRDP) මාර්ග 69ක් ඉදිකිරීම සඳහා එකතුව රුපියල් මිලියන 99ක ප්‍රතිපාදන වෙන්කර වෙරුගල් සහ මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදී තිබූ අතර, ඉදිකිරීම් සඳහා එකතුව රුපියල් මිලියන 21.98ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කර තිබූ නමුත් ප්‍රවර්ථන වර්ෂය වන විටදී මෙම කාර්යයන් සියල්ල අඛණ්ඩව ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

2006 වර්ෂයේ නිකුත් කළ ප්‍රසම්පාදනය මාර්ගෝපදේශ සංග්‍රහයේ හා 2012 අගෝස්තු 08 දින නිකුත් කළ අතිරේක 27 (Supplement -27) හි 2.8.1 (අ) යටතේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් (Department Procurement Committee) විසින් සියලු ප්‍රසම්පාදන සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කළ යුතු වුවද තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේ රු.950,000 ක විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ සාලියපුර ගොවි සංවිධානයට බෙදා දීම සඳහා මිලදීගත් උදළු තල හා කුකුළු පැටවුන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කන්තලේ පොලිසිය ඉදිරිපිට තනි පුද්ගල රජයේ පේලි නිවාසය ඉතා පැරණි බැවින් හා පදිංචියට සුදුසු තත්වයේ නොපවතින බැවින් කඩා ඉවත් කිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශය ලැබී තිබෙන බව අතිරේක දිසාපති හා අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ අංක GAT/EST/DSDIV/MA06/11(Kan) හා 2022 මාර්තු 14 දිනැති ලිපිය මගින් දන්වා තිබුණි. විගණිත දින වූ 2024 ඔක්තෝබර් 22 දින වනවිට එම ගොඩනැගිල්ලේ නිවාස 07 කින් නිවාස 05 ක පදිංචියව සිටින අතර අදාල නිවාසයන්හි පදිංචිය අනාරක්ෂිතව පවතින බව නිරීක්ෂණය විය ඉහත ලිපිය අනුව කඩා ඉවත් කිරීමට නිර්දේශය ලැබී වසර 02 මාස 07 ක් ඉක්මවා තිබුණද අදාල ඉවත් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් නිලනිවාස 02 ද ඇතුළත්ව නිල නිවාස 07ක් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්ව පැවතියද නිල නිවාස 02 ක පමණක් පදිංචිව සිටින බව නිරීක්ෂණය වූ අතර එම පදිංචිව සිටින නිල නිවාස 02 ද අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතින බැවින් පවත්නා වත්කම්වල ප්‍රශස්ථ උපයෝජනය ලබා ගත නොහැකි මට්ටමක පවතී. ඒ අනුව පැරණි ප්‍රාදේශීය ලේකම් නිලනිවස, සෝමපුර සංචාරක ධංගලාව සහ වසර 42ක් ඉක්මවා ඇති පොදු නිලනිවාස 05ම අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.

4.4 පාඩු හා හානි

අනතුරට ලක්වූ ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් KB-0957 දරණ ජීප් රථය නැවත යතා තත්වයට පත්කිරීම වෙනුවෙන් වැයවූ රු.2,124,270 ක අලාභය රක්ෂණ ආයතනය මගින් හානි පූරණය කරගැනීමට නොහැකිවීම තුල රජයට එම වටිනාකමින් අලාභයකි සිදුවී පැවතුණි. තවද මරණයට පත් රියදුරාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව සිදුවී ඇති කුවාලවල ස්වභාවයෙන් අනාවරණය වනුයේ අනතුරට ලක්වන විට රථය පදවා ඇත්තේ A.P.G.G.සුමිත් ජයතිලක යන අය නොවන බවයි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ග්‍රාම නිලධාරී ලෙස සේවයේ නියුතුව සිටි එම්.ඒ.එම්.හාරික් මහතා 2018 ජූලි 09 දින සිට වැඩ තහනමට ලක්ව සිටින අතර ඔහු රාජ්‍ය සේවයේ යෙදී සිටියදී ලබා ගෙන තිබූ ආපදා ණයවලින් රජයට ගෙවිය යුතු ණය ශේෂය රු.233,641 ක් විය. විගණිත දිනය වූ 2024 නොවැම්බර් 13 දින වනවිට වසර 06 මාස 04 ක කාලයක් ඉක්ම වුවද මෙම ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් සමාලෝචන වර්ෂය දක්වා එකතුව රු. 524,931,349 ක් වටිනා දිගුකාලීන ඉඩම් සහ ගොඩනැගිලි බදු කුලී ආදායම් දිගුකලක සිට අයකර නොගෙන හිඟ හිටිව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් සමාලෝචන වර්ෂය දක්වා එකතුව රු 868,636ක කෙටිකාලීන ඉඩම් සහ කෙටිකාලීන බදු කුලී ආදායම් අය නොකර හිඟහිටිව පැවති අතර මෙම හිඟහිටි මුදල අයකර ගැනීමට එලදායී පියවර ගෙන නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 3,259,878 ක් වූ රජයේ නිලධාරීන් සඳහා ලබාදුන් අත්තිකාරම් වෙනුවෙන් දිගුකාලයක සිට අයකර නොගත් හිඟහිටි ණය ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) වාහන 12 ක් සම්බන්ධව රු.5,678,948 ක වටිනාකමින් යුතු අලාභ හානි වෙනුවෙන් 1999 වර්ෂයේ සිට 2024 දක්වා වසර 25 ක් ගතවන තුරුත් සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කොට නොමැති බව නිරීක්ෂණය විය.

(ඊ) මූතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාල පාලතෝප්පූර් සහ තාහානගර සමෘද්ධි බැංකු විසින් එකතු වටිනාකම රුපියල් 356,016,774 ක්වූ ණය ලබාදී තිබූ අතර, ණය මුදල් හා පොලී අයකර ගැනීම් සම්බන්ධව ණය කාඩ්පත් හා ණය ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමබව මෙමඟින් අනාවරණය විය.

(උ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ප්‍රාදේශීය ලේකම් සඳහා උපලේඛනගත නිලනිවාස 02ක් පවතින අතර ඉන් එකක් 2018 වර්ෂයේ ඉදිකර දැනට සමෘද්ධි කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. අනෙක් නිල නිවාසය දැනට අබලන් තත්වයේ පවතින බව හා එම නිලනිවස අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයේ පවතින අතර ප්‍රාදේශීය ලේකම්වරයා එම නිලනිවාසයේ පදිංචි වී නොතිබුණි.

(ඌ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් උපලේඛනගත නොවන අනෙකුත් නිලනිවාස 05 හා සෝමපුර සංචාරක බංගලාවේ ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නොවන අතර එම ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීම මේ වන විටත් සිදුකර නොතිබුණි.

(එ) නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කලමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ සේවය කල පී.ජනන්තිනී මිය රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශයේ 2015 සැප්තැම්බර් 08 දිනැති ලිපිය අනුව, මෙම තනතුරට 2015 සැප්තැම්බර් 15 දින පත්කර තිබූ අතර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා හා පළාත්පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PMAS/64473 හා 2023 අප්‍රේල් 10 දිනැති පත්වීම අවසන් කිරීමේ ලිපිය අනුව සේවය අවසන් කිරීමට කටයුතු කර තිබුණි. මෙම නිලධාරිනිය විසින් ව්‍යාජ වීහාග ප්‍රතිඵල ඉදිරිපත් කර 2015 සැප්තැම්බර් 15 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රුපියල් 3,305,197 ක් ලබාගෙන තිබුණි. ඊට අමතරව ලබාගෙන තිබූ ආපදා ණය වල 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රුපියල් 205,650 ක්වූ අතර 2015 ඔක්තෝබර් 14 දින සිට 2016 පෙබරවාරි 25 දින දක්වා සම්පූර්ණ වැටුප් සහිතව ප්‍රසූත නිවාඩු හා 2019 අගෝස්තු 27 දින සිට 2019 සැප්තැම්බර් 05 දින දක්වා දින 10ක් දිවයිනෙන් බැහැර නිවාඩුද ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් අදාල නිලධාරියා හා නියමිත කාලයන්හි අධ්‍යාපන සුදුසුකම් වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි වූ වගකිව යුතු නිලධාරීන් සියල්ලද වගකීමට බැඳෙන බැවින් රජයට සිදුවූ අලාභය පියවීමට කටයුතු කල යුතුය.

(ඒ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාළව ක්‍රියාත්මක වන සමෘද්ධි බැංකු 22 අදාළව 2024 දෙසැම්බර් 31 වන විටත් අයකර නොගෙන පවතින හිඟ ශේෂය රු.209,472,396 ක් වේ.

5 තිරසාර සංවර්ධනය

තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් සිදු කර නොතිබුණි.

6 මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 17 ක් ද, තෘතියික මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 21 ක්ද, ද්විතියික මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 56 ක් හා ප්‍රාථමික මට්ටමට අයත් නිලධාරී තනතුරු පුරප්පාඩු 39 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 133 ක්ව පැවතුණි.

(ආ) සමාලෝචන වර්ෂය තුලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05ක් ඉක්මවා සිටින නිලධාරීන් 455 දෙනෙකු සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදුවී තිබුණි.

(ඇ) කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමත සංවර්ධන නිලධාරී තනතුරු ප්‍රමාණය 08 ක් වුවද, සංවර්ධන නිලධාරීන් 17 ක් අනුයුක්ත කර තිබුණු අතර ඒ අනුව සංවර්ධන නිලධාරීන් 09 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ඈ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අනුමත සංවර්ධන නිලධාරී තනතුරු ප්‍රමාණය 39 ක් වුවද සංවර්ධන නිලධාරීන් 45 දෙනෙකු අනුයුත්ක කර තිබුණු අතර ඒ අනුව සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ඉ) නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අනුමත සංවර්ධන නිලධාරී තනතුරු ප්‍රමාණය 08 ක් වුවද සංවර්ධන නිලධාරීන් 22 දෙනෙකු අනුයුත්ක කර තිබුණු අතර ඒ අනුව සංවර්ධන නිලධාරීන් 14 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

එම්.ඒ.වී.එම්.අරඟාත්,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය
2024 වසරේ වාර්ෂික සැලැස්ම තුල අන්තර්ගත ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය

අංකය	විශේෂ දර්ශක (හඳුනාගත් ප්‍රමුඛ මහජන සේවාවන්)	අපේක්ෂිත වාර්ෂික ඉල්කක	සමුච්චිත ප්‍රගතිය	තත්‍ය ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රතිඵලවල ප්‍රතිශතයක් ලෙස		
				100%-90%	**75%-89%**	**50%-75%**
1	උපත්, විවාහ, මරණ සහතික ලියාපදිංචිය	37016	64875	√		
2	ජාති හැඳුනුම්පත් සඳහා අයදුම්පත් සකස් කිරීම	14852	15190	√		
3	ඉඩම්බලපත්‍ර හා ඔප්පු සකස් කිරීම	5975	2574			
4	ආදායම් බලපත්‍ර අලුත් කිරීම හා නිකුත් කිරීම	70310	73011	√		
5	ගැබිණි මව්රුන් සඳහා පෝෂණ කූපන් නිකුත් කිරීම	48678	38994		√	
	සමස්ථ කාර්යසාධනය	**176,831**	**194,654**	√	-	

5. තිරසර සංවර්ධන අරුමුණු (එස්ඩීජී) සපුරා ගැනීමේ කාර්ය සාධනය 2024

5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

අංකය	ප්‍රධාන විෂය ක්ෂේත්‍රය	මූලික ක්‍රියාකාරම්	තිරසාර සංවර්ධන අභිමතාර්ථ/අරමුණ			ප්‍රතිදානය (මූලික කාර්ය සාධන දර්ශකය)		සාධන ලබාගැනීමේ ප්‍රගතිය		
						ඒකක ගණන්	සාධනය	0 %-49%	54 %-74 %	75% - 100 %
1	අධ්‍යාපනය	• පන්ති කාමරය නවීකරණය • පාසල් ගොඩනැගිලි නවීකරනය • වැසිකිලි ඉදිරි කිරීම හා නවීකරණය • පාසල් ක්‍රීඩා පිටිය ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම • පාසලට ගෘහ භාණ්ඩ උපකරන ලබා දීම	04. හොඳ අධ්‍යාපනයක්	4.1.1 4.1.2		4,988	අප දිස්ත්‍රික්කයේ සාක්ෂරතා වය 1%කින් වැඩි ඇත		√	
2	පශු සම්පත්	• එළුවන් හා හරකුන් පැටවුන් සැපයීම • ජනතාවගේ දියුණුව සඳහා ජීවනෝපය ද්‍රව්‍ය සැපයීම	02. ශූන්‍ය කුසගින්න 01.දුප්පත්කම නැත	2.1.1 2.2.2 1.1.1 1.2.1 1.4.1 1.5.2 1.a.1	2.1.2	850	ප්‍රදේශයේ දුරිදුතා රේඛාව 5% කින් පහත වැටී ඇත මන්දපෝෂණ තත්වය 1%කින් අඩු වී ඇත		√	
3	පානිය ජලය	• ලිං හා නළ ලිං ඉදි කිරීම. • ප්‍රජා පානිය ජල යෝජනා ක්‍රමයක් ඇති කිරීම. • ආර් ඕ බලාගාර ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම. • ජල සම්බන්ධතා සැපයීම	6. පිරිසිදු පානිය ජලය හා සනීපාරක්ෂාව	6.1.1 6.2.1 6.3.1 6.4.1 6.5.1 6.a.1	6.4.2	6,160	ගුණාත්මක පානිය ජලය භිගය 4%කින් අඩු කර ඇත. රෝග වලින් තොර මිනිසුන්ගේ ජීවිතය වැඩි දියුණු කිරීම		√	
4	විදුලි බලය	• විදුලි සම්බන්ධතා සැපයීම • සෝලර් පැනල් සවි කිරීම	07.දැරිය හැකි පිරිසිදු බල ශක්තිය	7.1.1 7.b.1	7.1.2	1,295	විදුලි අවශ්‍යතාවය 1%කින් අඩු වී ඇති බව සොයා ගන්නා ලදි.	√		

		• විදි ලාම්පු සවි කිරීම					ආරක්ෂිත විදුලිය භාවිතය.			
5	පෝෂණය හා සෞඛ්‍ය	• පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර වැඩසටහන ලබා දීම • බෝ වන හා බෝ නොවන රෝග සඳහා සායන සහ ආයුර්වේද රෝහල් වැඩි දියුණු කිරීම. • සෞඛය සේවා සඳහා වෛද්‍ය උපකරන සැපයීම. •	03.යහපත් සෞඛ්‍ය 02. ශූන්‍ය කුසගින්න 04.හොඳ අධ්‍යාපනයක්	3.1.1 3.2.1 2.1.1 2.2.1 2.4.1 4.2.1 4.3.1	2.2.2 4.2.2	9,200	පෝෂණ මට්ටම 1.5% කින් වැඩි වීම සාක්ෂරතා වය අනුපාතය 1% කින් වැඩි වීම ළදරු මරණ අනුපාතය 1%කින් අඩු වී ඇත.	√		
6	වන ජීවීන් හා මිනිස්සු අතර ගැටුම්	• අලි වැට සවි කිරීම • වායු තුවක්කු සැපයීම	1.5 ගොඩ බිම ජීවිතය	1.5.1 1 15.a. 1		800	ප්‍රදේශයේ අලි මිනිස් ආරවුල් වලින් 2% ඉවත් කර ඇත.	√		
7	සංචාරක සංවර්ධනය	• යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම • ප්‍ර විශ මාර්ග ඉදිරි කිරීම හා ප්‍රතිසංස්කරනය කිරීම • ආගමික ස්ථාන වල භූමි අලංකරනය	08. යහපත් වැඩ හා ආර්ථික වර්ධනය	8.5.1 8.9.1	8.5.2 8.9.2	4800	දේශීය හා විදේශීය සංචාරක ව්‍යාපාරය 4%කින් වැඩි වී ඇත.	√		
8.	ප්‍රජා සංවර්ධනය	• පොදු ගොඩනැගිලි, පොදු වැසිකිලි ,උද්‍යාන ,සුසාන භූමි,ක්‍රීඩා පිටි ,වෙළඳ පොල ,පන්සල්, බහු කාර්ය ගොඩනැගිලි ප්‍රතිසංස්කරනය කිරීම හා ඉදිරි කිරීම • අත්‍යවශ්‍ය උපකරන සැපයීම • නිවාස අලුත්වැඩියා සහ ඉදි කිරීම • ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීම	11තිරසාර නගර හා ප්‍රජාවන්	11.1.1 11.a.1		8,500	ජනතාවගේ මූලික අවශ්‍යතා අනුව ජීවිත තත්වය ඉහල නැංවීම 2% විදුලි බලය ශක්තිමත් කිරීම තිරසාර යටිතල පහසුකම්			√

		• ප්‍රවේශ මාර්ග වැඩි දියුණු කිරීම • ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීම • බෝක්කු හා ජලපවහන ඉදි කිරීම								
9	කෘෂිකර්ම හා වාරිමාර්ග දෙපාර්ත මේන්තුව	• වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා ඉදිරි කිරීම • කෘෂි ළිං ඉදිරි කිරීම • ගෙවතු වගා වැඩ සටහන • පැල තවාන් ස්ථාපනය කිරීම • ගොවින්ට කෘෂී උපකරණ ලබා දීම • කෘෂී මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම	02. ශූන්‍ය කුසගින්න 01.දුප්පත්කම නැත	2.1.1 2.2.2 2.3.1 1.1.1 1.2.1 1.4.1 1.5.2 1.a.1	2.1.2 2.3.2	2565	ගොවීන්ගේ ජීවනෝපාය කටයුතු 1% කින් වැඩි කිරීම ගොවීන්ගේ ජීවන තත්වය 2% කින් වැඩි කිරීම. ග්‍රාමීය දිළිඳුකම අඩු කිරීම		√	
10	පාරිසරික ආරක්ෂාව	• ඝන අප්‍රද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය • කසළ බඳුන් ලබා දීම • ජලපවාහන ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම	11. තිරසාර නගර සහ ප්‍රජාවන් 6. පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව	11.6.1 6.31		1988	පිරිසිදු සමාජයක් නිර්මාණය කර පිරිසිදු රටක් බවට පත්වීම ආපදා වැළැක්වීම		√	

5.2. තිරසර සංවර්ධ ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

ත්‍රීකුණාමලය දිස්ත්‍රික්කය වූ කලි කිලීන ස්භාවික විපත් හා දිගුකාලයක් පැවැති යුද්ධය නිසා පසුගාවීම තත්තවට පත් වූ දිස්ත්‍රික්කයකි. සිවිල් පරිපාලනය හා සාමාන්‍ය ජන ජීවිතය යලි ස්ථාපිත කිරීමත් සමඟ, ඉතා සීඝ්‍රයෙන් දියුණුවන දිස්ත්‍රික්කයක් බවට එය පති වී ඇත.

තිරසාර සංවර්ධන ඉලක්කයන් ලඟාකර ගැනීම සමස්ථයක් ලෙස මෙම දිස්ත්‍රික්කයට අභියෝගයක් වන නමුත්, දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ අවශ්‍යතා හා තිරසාර සංවර්ධන අරමුණු 17 හි ඇතුලත් කරුණුද සැලැකිල්ලට ගනිමින් දිස්ත්‍රික් කාර්යාලයේ සංයුක්ත සැලැස්ම සකස් කර ඇත.

ඉහත අනු ශීර්ෂ 4.1 හි විස්තර කර ඇති පරිදි සැලැසුම් කර තිබූ ඉලක්කයන්ගෙන් බොහොමයක් අපේක්ෂිත මට්ටමට ළඟාකර ගැනීමට හැකි වී ඇත. එමෙන්ම දිස්ත්‍රික් ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා තව බොහෝ දුර යාමට ඇත.

සාමාන්‍ය ජන ජීවිතයේ ඇති වන දූවිචාවචන තත්ත්වයන්, ආර්ථිකයේ ඇති වන උච්චාවචනයන් මෙන්ම ත්‍රස්ථවාදි කටයුතු හා ස්භාවික විපත් නිසා නීතිය හා සාමය පවත්වාගෙන යාමට ඇති වන බාධාවන් නිසා සැලැසුම් කළ කාර්යයන් එහි උපරිමයෙන් ස්ථාපනය කිරීමට අපහසු මෙන්ම එහි ප්‍රතිඵල සැලසුම් කළ ආකාරයටම ළඟා ගැනීම අභියෝගයක් ව පවතී.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	59	42	14
තෘතීයික	40	19	21
ද්විතියික	1,025	969	56
ප්‍රාථමික	145	106	39
	1,269	**1,136**	**133**

6.2. ආයතනයේ කාර්ය සාධන උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ත්‍රීකුණාමලය දිස්ත්‍රික්කයේ සමස්ථයක් ලෙස කාර්ය මණ්ඩයෙන් අනුමත මට්ටමට වඩා 133 ක ඌණතාවක් පවති. කාර්ය මණ්ඩලයේ හිඟයක් පැවැතීම පෙර වසර වල දිගින් දිගටම පැවැති ගැටළුවක් වන නමුත් මෑතකාලී දෙවසර වන විට එම හිඟය අඩුකැගැනීමට හැකි වී ඇත.

දිස්ත්‍රික්කයේ සිවිල් ජනයා වෙත සිය සේවාන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිකව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තෘතීක මට්ටමේ නිලධාරී ඌණතාවය දැඩිව බලපා ඇත. දැනට සිටින තත්‍ය කාර්ය මණ්ඩලයට සමානුපාතිකව ජ්‍යෙෂ්ඨ හා තෘතීක මිට්ටමේ නිලධාරීන්ගේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 61 ක් හා 38 ක මට්ටමක පවතී. මෙම තත්ත්වය දෛනික පරිපාලන තත්තවයට දැඩිව බලපානු ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්භාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය කළමණාකරන සේවා නිළධාරි සේවයේ දෙමළ මාධ්‍ය කාර්යක්ෂමතා කඩඉම	63	දින 10	91,636.18	-	දේශීය	කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම
රාජ්‍ය කළමණාකරන සේවා නිළධාරි සේවයේ සිංහල මාධ්‍ය කාර්යක්ෂමතා කඩඉම	22	දින 10	67,118.64	-	දේශීය	කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද කෙටියෙන් පැහැදිලි කරන්න

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපනය කර ඇති දිස්ත්‍රික් කුසලතා සංවර්ධන ඒකකය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යායේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාවල දැනට සිටින කාර්ය මණ්ඩලයේ හා අලුතින් එක්වන කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා, ආකල්ප සහ නිපුණතා වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි. සේවකයන්ගේ දෛනික සේවා සැපයීම සඳහා අවශ්‍ය වන සීමිත සහ තෝරාගත් ක්ෂේත්‍රවල මූලික පුහුණු ලබාදීම සිදු කරනු ලබයි. මෙය දිස්ත්‍රික් ලේකම් කාර්යාලේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාවල සේවකයන්ගේ සේවා ඵලදායි බව ඉහළ නැංවීම සඳහා බෙහෙවින් උපකාරී වී ඇත.

එමෙන්ම නැගෙනහිර පළාත් සභාවේ හා දාස්ත්‍රික්කයේ ඇති වෙනත් දෙපාර්තමේන්තු වල කාර්යය මණ්ඩලය ද මේ සඳහා

මේ වන විට බොහෙමයක් ම රාජ්‍ය සේවා ලබාදීමේ ක්‍රම වේද නව තාක්ෂණය සමඟ සමපාතව ඇති නිසා සෑම කාර්යය මණ්ඩලයේ අයකුම එම දැනුම ලබාගැනීම අනිවාර්යය කර ඇත. එමෙන්ම භාෂා කුසලතා ලබැගැනීම, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ වෙනත් රැකියාව සම්බන්ධ දැනුම පුහුණුව ලබා ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවක් කොට සලකනු ලැබේ. මෙමගින් අවසාන වශයෙන් අපේක්ෂා කරනුයේ රාජ්‍ය සේවාවේ ඵලදායි බව ඉහළ නැංවීමයි.

07. පරිච්ඡේදය අනුකූලතා වාර්තාව

අදාල කරගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල කොවීමට කෙටි පැහැදිළි කිරීම	අනනුකූලබව වලක්වා ගැනීමට ක්‍රියාමර්ග
1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම්			
1.1. වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3. ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.4. ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5. විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6. වෙනත්	අදාල නොවේ		
02. පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)			
2.1.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/218 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන් කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2. පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩිපත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3. විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4. අභ්‍යන්තර විගණන වාර්තා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5. සියළුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙළ කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6. චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7. ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8. තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9. හානි/පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10. බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11. උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ - එන්20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		

03. මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)			
3.1. මුල්‍ය බලතල ආයතනය තුල පවරා දී තිබීම	අනුකූලවේ		
3.2. මුල්‍ය බලතල පවරා දීම ආයතනය තුල පවරා දී තිබීම	අනුකූලවේ		
3.3. සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූලවේ		
3.4. 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රාජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත් ව කටයුතු කිරීම	අනුකූලවේ		
04. වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම	අනුකූලවේ		
4.3. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4. වාර්ෂක අයවයැ ඇස්තමේන්තු සක්ස කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
5. විගණන විමසුම්			
5.1. විගණකාධිපතිවරයා විසින් නියමිත කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූලවේ		
06. අභ්‍යන්තර විගණනය			
6.1. මු.රෙ. 134 (2), DMA/1-2019, අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2. සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(04) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4. මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
07. විගණන හා කළමනාකරණ කමිටු			
7.1. සීඑම්ඒ චක්‍රලේඛ 01- 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කටිටු 4ක් වත් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
08. වත්කම් කළමනාකරණය			
8.1. අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම්	අනුකූලවේ		

මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝල්ර් ජනරල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2. ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝල්ර් ජනරාල් කාර්යාලය වෙත යොමු කිරීම	අනුකූලවේ		
8.3. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාන්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපත්වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූලවේ		
8.5. ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූලවේ		
09. වාහන කළමනාකරණය			
9.1. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2. වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූලවේ		
9.3. වාහනයේ ලොග් පොත් පවත්වා ගනිමින් යාවත්කාලීක කර තිබීම	අනුකූලවේ		
9.4. සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5. 2016-12-29 දිනැති අංක 2016-/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා	අනුකූලවේ		
9.6 කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අදාල නොවේ		
10. බැංකු ගිණුම් කළමනාකරණය			
10.1නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2. සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට ගෙන අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
11. ප්‍රතිපාදන උපයෝජනය			
11.1 සලසා තිබුණු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		

11.2. මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලවේ		
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			
12.1. සීමාවන් වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2. හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූලවේ		
12.3. වර්ෂයකට වැඩි කාලයක් සිට පැවත එන හිග හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13. පොදු තැන්පත් ගිණුම			
13.1. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2. පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14. අග්‍රිම ගිණුම			
14.1. සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුය වෙත ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3. මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4. අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15. ආදායම් ගිණුම			
15.1. අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.2. රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූලවේ		
15.3. මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ගිබීම	අනුකූලවේ		
16. මානව සම්පත් කළමනාකරණය			
16.1. අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2. කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලවේ		
16.3. 20.09.2017 දිනැති එම්එස්ඩී චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		

17. මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1. තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු ලබාදීමේ නිලධාරියකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2. ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා පබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංසා/චෝදනා ප ල කිරීමට පමසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3. තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1 අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූලවේ		
18.2. එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1. 2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස්කොට තිබීම	අනුකූලවේ		
19.2. කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		
19.3. ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලවේ		
19.4. ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම	අනුකූලවේ		
20. විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1. ඉකුත් වාර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූලවේ		